5

ශ්‍රී ලංකා 1:50,000 භූ ලක්ෂණ සිතියම් කියවීම



භූ දර්ශනයක ඇතුළත් භෞතික ලක්ෂණ හා මානුෂ හෙවත් සංස්කෘතික ලක්ෂණ සිතියම් මගින් ඉදිරිපත් කෙරේ. ශ්‍රී ලංකාවේ භූ ලක්ෂණ සිතියම්වලින් නිරූපණය කෙරෙන භෞතික හා සංස්කෘතික ලක්ෂණ අධ්‍යයනය කිරීම මෙම ඒකකයෙන් බලාපොරොත්තු වේ.

ශ්‍රී ලංකා 1:50, 000 භූ ලක්ෂණ සිතියම්

භූ ලක්ෂණ සිතියමක පරිමාණය, විශාලත්වය මෙන් ම තෝරාගත් භෞතික හා සංස්කෘතික ලක්ෂණ කිහිපයක් පිළිබඳ ව ඔබ 8 වන ශ්‍රේණියේ දී අධ්‍යයනය කර ඇත. ශ්‍රී ලංකාවේ භූ ලක්ෂණ දැක්වීම සඳහා 1:50, 000 පරිමාණයෙන් සිතියම් පත්‍ර 92ක් සකස් කර තිබේ. එම භූ ලක්ෂණ සිතියම්වල අන්තර්ගත භෞතික හා සංස්කෘතික ලක්ෂණ කියවීමට ඒවායේ වටතීරුවේ පහළ කොටසේ ඇති සම්මත ලකුණු හා සංකේත ඇතුළත් සූචකය භාවිත කිරීමට පුළුවන. පාසලේ ඇති 1:50, 000 භූ ලක්ෂණ සිතියම් පත්‍රයක් භාවිත කොට වටතීරුවේ සඳහන් වන සම්මත ලකුණු හා සංකේත හඳුනාගන්න.

1:50, 000 භූ ලක්ෂණ සිතියම්වල භූ විෂමතා ලක්ෂණ සමෝච්ච රේඛා මගින් දක්වා ඇති බව ඔබ මේ වන විට අධ්‍යයනය කර ඇත. සමෝච්ච රේඛා විහිදී ඇති ආකාරය තේරුම් ගැනීමෙන් භූ රූප පහසුවෙන් හඳුනාගත හැකි වේ.

මිනිසාගේ මැදිහත් වීමෙන් භෞතික පරිසරය මත ගොඩනගා ඇති සියලු දේ සංස්කෘතික ලක්ෂණ වශයෙන් හැඳින්වේ.



5.1 සිතියම - 1:50 000 භූ ලක්ෂණ සිතියමක කොටසක්

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

5.1 රූපය - 1:50 000 භූ ලක්ෂණ සිතියමක සම්මත සලකුණු දක්වන සටහන

ශ්‍රී ලංකාවේ 1:50 000 භූ ලක්ෂණ සිතියම් පත්‍රයක කොටසක් අධ්‍යයනය කිරීමෙන් සිතියමෙහි නිරූපිත භෞතික හා සංස්කෘතික ලක්ෂණ හඳුනාගනිමු.

ක්‍රියාකාරකම

01. 5.1 රූපයෙහි දැක්වෙන සූචකය හොඳින් අධ්‍යයනය කරන්න.

02. 5.1 සිතියම හොඳින් නිරීක්ෂණය කොට සිතියමෙහි 1 සිට 20 දක්වා අංකවලින් දැක්වෙන භෞතික හා සංස්කෘතික ලක්ෂණ වෙන් වෙන් වශයෙන් අංක අනුව නම් කරන්න.

03. එම ලක්ෂණ සම්මත වර්ණ හා සංකේත මගින් ඇඳ දක්වන්න.

භෞතික ලක්ෂණ

1:50 000 හු ලක්ෂණ සිතියමක දැක්වෙන තෝරාගත් භෞතික ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

- තැනිතලාව
- උස්බිම
- ප්‍රධාන ගංගාව
- අතු ගංගාව
- ගංගා නිම්නය
- දූපත
- තුඩුව
- මුහුදු බොක්ක

තැනිතලාව - තැනිතලාවක් යනු භූමියේ පිහිටි සමතලා ප්‍රදේශයකි. සිතියමක සමෝච්ච රේඛා අතර පරතරය පුළුල් වීම මගින් තැනිතලා බිමක් හඳුනාගත හැකි ය. තැනිතලා ප්‍රදේශයක වුව ද තැනින් තැන පිහිටි කුඩා උස් තැන් ද ඇත. මෙවැනි ප්‍රදේශ සිතියමේ දක්වා ඇති ස්ථානීය උස ආධාරයෙන් හඳුනා ගැනීමට පුළුවන. (5.2 රූපය).

උස්බිම - භූමියේ උසින් වැඩි ප්‍රදේශ උස්බිම් ලෙස හැඳින්වේ. සිතියමෙහි සමෝච්ච රේඛා එකිනෙකට ළං ව විහිදී තිබීමෙන් උස්බිමක් හඳුනාගත හැකි ය.

5.2 රූපය - තැනිතලාව

5.2 සිතියම - තැනිතලාව සහ උස්බිම

ගංගා නිම්නය - උස්බිම් අතර පිහිටි දිගැටි හැඩයෙන් යුත් පහත් බිම්, නිම්න ලෙස හැඳින්වේ. ප්‍රධාන ගංගා හා අතු ගංගා එම නිම්න ඔස්සේ ගලා බසී.

ප්‍රධාන ගංගාව - භූතලය මත උස්බිමක සිට කිසියම් ප්‍රදේශයක් හරහා සාගරයකට හෝ විලකට ගලා බසින විශාල ජල ධාරාව ප්‍රධාන ගංගාව ලෙස හැඳින්වේ.

අතු ගංගාව - ප්‍රධාන ගංගාවට ජලය සපයන කුඩා දිය දහරා අතු ගංගා වේ.

5.3 රූපය - ගංගා නිම්නය

5.3 සිතියම - ගංගා නිම්නය

වෙරළබඩ ප්‍රදේශවල ද විවිධ භූ ලක්ෂණ දක්නට ලැබේ. දූපත, තුඩුව, මුහුදු බොක්ක එවැනි භූ ලක්ෂණ කිහිපයකි.

5.4 රූපය - දූපත, තුඩුව සහ මුහුදු බොක්ක

දූපත - මුහුදෙන් වට වී ඇති කුඩා ගොඩබිම් ප්‍රදේශ දූපත් නමින් හැඳින්වේ. වයඹදිග වෙරළෙහි යාපන අර්ධද්වීපය ආශ්‍රිත ව දූපත් බහුල ව පිහිටා ඇත.

තුඩුව - සාගරය දෙසට නෙරාගිය පටු ගොඩබිම් කොටස් ද වෙරළ තීරයේ දක්නට ඇත. ඒවා තුඩු ලෙස හැඳින්වේ.

මුහුදු බොක්ක - ගොඩබිම දෙසට කා වැදුණු මුහුදු ප්‍රදේශය මුහුදු බොක්ක ලෙස හැඳින්වේ.

5.4 සිතියම - දූපත, තුඩුව සහ මුහුදු බොක්ක

සංස්කෘතික ලක්ෂණ

1:50 000 හූ ලක්ෂණ සිතියමකින් තෝරා ගන්නා ලද සංස්කෘතික ලක්ෂණ කිහිපයක් අධ්‍යයනය සඳහා යොදා ගෙන ඇත.

- දිස්ත්‍රික්ක මායිම
- අධිවේගී මාර්ග
- මහාමාර්ග (A සහ B ශ්‍රේණි)
- සෙසු මාර්ග (ද්විතීයක/ අප්‍රධාන)
- දුම්රිය මාර්ග
- වී, තේ, පොල්, රබර් සහ ගෙවතු වගා බිම්
- ආගමික සිද්ධස්ථාන
- පාසල, රෝහල, පොලිසිය හා තැපැල්හල

මෙම සංස්කෘතික ලක්ෂණ විවිධ සංකේත හා වර්ණ මගින් සිතියමෙහි දක්වා ඇත.



5.5 රූපය - විවිධ සංස්කෘතික ලක්ෂණ

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් සම්මත සංකේත හා වර්ණ සංශෝධනය කර නව සිතියම් පත්‍ර මුද්‍රණය කරනු ලැබේ. දැනට නිම කොට ඇති සිතියම් පත්‍ර අංක 02 පේදුරු තුඩුව සිතියමෙන් උපුටා ගන්නා ලද සිතියම් කොටසක් 5.5 සිතියමෙන් දක්වා ඇත. මෙම නව සිතියම්වල ඇතැම් සංකේත හා වර්ණ වෙනස් කර තිබේ.

5.5 සිතියම - පේදුරුතුඩුව නව සිතියම (2017)

භෞතික ලක්ෂණ හා සංස්කෘතික ලක්ෂණ අතර ඇති සම්බන්ධතාව

ශ්‍රී ලංකාවේ 1:50 000 භූ ලක්ෂණ සිතියම කියවීමේ දී භෞතික හා සංස්කෘතික ලක්ෂණ අතර සම්බන්ධතාවක් ඇති බව ඔබට පැහැදිලි වනු ඇත. ප්‍රදේශයක පවතින භූ විෂමතාව සහ ජලවහනය යන භෞතික ලක්ෂණ එම ප්‍රදේශවල ජනාවාස, භූමි පරිභෝගය, වාරිමාර්ග පද්ධති සහ මාර්ග රටාව යන සංස්කෘතික ලක්ෂණ අතර සමීප සබඳතාවක් පවතී. පරිපාලන මායිම් තීරණය කිරීමේ දී ද බොහෝ දුරට භෞතික ලක්ෂණ උපයෝගී කරගෙන ඇත.

- තැනිතලා ප්‍රදේශවල ජනාවාස පුළුල් ලෙස පැතිරී ඇත. කඳුකර ප්‍රදේශවල ජනාවාස පිහිටා ඇත්තේ ඒ අතර පිහිටි පහත් බිම් හා නිම්න ප්‍රදේශවල යි.

- කෘෂිකාර්මික භූමි පරිභෝගය බොහෝවිට භූ විෂමතාවට හා ජලවහනයට අනුකූල ව ව්‍යාප්ත ව ඇති බව භූ ලක්ෂණ සිතියම්වලින් පැහැදිලි වේ.

- තැනිතලා ප්‍රදේශවල ගංගා නිම්න ආශ්‍රිත ව පුළුල් ව විහිදුණු වී වගා බිම් ද, කඳුකර ගංගා නිම්න ආශ්‍රිත ව පිහිටි බිම්වල පටු දිගටි ලෙස විහිදුණු වී වගා බිම් ද දක්නට ඇත.

- කඳුකර ප්‍රදේශවල තේ වගාව ද, මධ්‍යම උසකින් යුත් කඳු බෑවුම් ප්‍රදේශවල රබර් වගාව ද, වෙරළබඩ සහ අවට ප්‍රදේශවල පොල් වගාව ද, ව්‍යාප්ත ව ඇත.
- වැව් සහ වාරිමාර්ග පද්ධති නිර්මාණය කිරීමේ දී ද, භූ විෂමතාව බලපා ඇති බව පැහැදිලි වේ. හෙල්වැටි අතර පිහිටි කපොලු හරහා ගලා බසින ගංගා හරස් කොට වේලි බැඳීමෙන් වැව් සාදා ඇත. බෑවුමට අනුව ඇළ මාර්ග ඔස්සේ ජලය සම්පාදනය කෙරේ.
- මහාමාර්ග ඉදිකිරීමේ දී ද, භෞතික ලක්ෂණ බලපා ඇත. තැනිතලා ප්‍රදේශවල මාර්ග රටාව බොහෝ විට ඍජු ව විහිදුණ ද කඳුකර ප්‍රදේශවල දී භූ විෂමතාවට අනුකූල ව විහිදෙන මාර්ග රටාවක් දක්නට ලැබේ. එහි දී මාර්ග ඉදිකිරීම සඳහා ගංගා නිම්න හා කපොලු බොහෝ දුරට උපයෝගි කරගෙන ඇත.
- පරිපාලන මායිම් නිර්ණය කිරීමේ දී ගංගා, කඳුවැටි යන භෞතික ලක්ෂණ ද පදනම් කරගෙන ඇත.

භෞතික හා සංස්කෘතික ලක්ෂණ අතර ඇති සම්බන්ධතාව පහත දැක්වෙන සිතියම් කොටස් දෙක අධ්‍යයනය කර වටහාගන්න.

5.6 සහ 5.7 සිතියම් - භෞතික හා සංස්කෘතික ලක්ෂණ අතර ඇති සම්බන්ධතාව

අභ්‍යාසය 01

5.8 සිතියම ඇසුරෙන් පහත දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. සිතියමෙහි දක්වා ඇති භෞතික ලක්ෂණ තුනක් නම් කරන්න.
2. සිතියම්ගත කර ඇති මාර්ග නම් කරන්න.
3. ප්‍රදේශයේ දක්නට ලැබෙන වගාවන් නම් කරන්න.
4. ගංගාවෙන් වෙන් වෙන පරිපාලන මායිම කුමක් ද?
5. ප්‍රදේශයේ බෝග වගාව සහ භූ විෂමතාව අතර ඇති සම්බන්ධතාව දැක්වෙන වාක්‍ය පහක් ලියන්න.

5.8 සිතියම - 1:50000 භූ ලක්ෂණ සිතියම් පත්‍රයක කොටසක්

ක්‍රියාකාරකම

පහත දැක්වෙන ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

හරහට

01. තැනිතලා ප්‍රදේශවල බහුල ලෙස ව්‍යාප්ත ව ඇත.

04. උස් බිමක සිට ගලාවිත් ප්‍රධාන ගංගාවට එකතු වේ.

06. භූමි පරිභෝග ලක්ෂණයකි.

07. බොහෝ දුරට නගර ආශ්‍රිත ව දක්නට ලැබෙන සේවා ස්ථානයකි.

පහළට

01. ඇළ මාර්ග දිගේ වගා බිම්වලට බෙදා හැරේ.

02. මේවා මගින් වැවේ සිට ගොවි බිම් දක්වා ජලය ගෙන යයි.

03. ගංගා ගලා බසින භූමි ප්‍රදේශය මේ නමින් හැඳින්වේ.

05. සාගරය දෙසට නෙරාගිය පටු ගොඩබිම් කොටසකි.

(1) ජ		(2)		■
	■		■	■
	■		■	(3)
■	■		■	
(4) අ	(5)			ගා
■		■	■	
(6)	ව		■	
■	■	■	■	
■	(7)	ලි		

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ආශ්‍රිත ග්‍රන්ථ සහ මූලාශ්‍ර

- මිහිතලයේ භෞතික පරිසරය, එච්. කේ. එන්. කරුණාරත්න
- ශ්‍රී ලංකා ජාතික සිතියම් සංග්‍රහය, පාසල් මුද්‍රණය, දෙවන සංස්කරණය, ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
- භෞතික භූගෝල විද්‍යාව I කොටස, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

පාරිභාෂික වචන

• භෞතික ලක්ෂණ	- Physical features	- பௌதிக அம்சங்கள்
• සංස්කෘතික ලක්ෂණ	- Cultural features	- பண்பாட்டு அம்சங்கள்
• තැනිතලාව	- Plain	- சமவெளி
• උස්බිම	- Highland	- உயர் நிலம்
• ප්‍රධාන ගංගාව	- Main river	- பிரதான ஆறு
• අතු ගංගාව	- Branch river	- கிளையாறு
• ගං නිම්නය	- River valley	- ஆற்றுப் பள்ளத்தாக்கு
• ද්වීපය	- Island	- தீவு
• දිස්ත්‍රික්ක මායිම	- District boundary	- மாவட்ட எல்லை
• අධිවේගී මාර්ගය	- Expressway	- பெருந்தெருக்கள்